සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

සැකසුම - ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය
ර/ඇඹි/ මාකඳුර විද්‍යාලය

8 ශ්‍රේණිය - සිංහල | දෙවන වාරය | දහහත්වන සතිය

## 11 වන පාඩම - සිරි ලංකා රට ම අපි (විශේෂණ පද)

විශේෂණ පද කොටස් 02 කි.

01. නාම විශේෂණ : නාම පදයක් විස්තර කරන පද නාම විශේෂණයි.

*කඩිසර දරුවා, හොඳ ළමයා, සිංහල පොත*

මෙහි *කඩිසර, හොඳ, සිංහල* යන පද නාම විශේෂණයි.

02. ක්‍රියා විශේෂණ : ක්‍රියා පදයක් විස්තර කරන පද ක්‍රියා විශේෂණයි.

*වේගයෙන් දුවයි, සෙමින් සෙල්ලම් කරයි, හොඳින් ක්‍රීඩා කරයි*

මෙහි *වේගයෙන් ,සෙමින්, හොඳින්* යන පද ක්‍රියා විශේෂණයි.

01 මෙම සටහන සටහන් පොතේ පිටපත් කරගන්න.

02. පහත සඳහන් නාම පදවලට සුදුසු විශේෂණ පද යොදා වාක්‍ය බැගින් නිර්මාණය කරන්න.

- **i.** දරුවා
- **ii.** කුරුල්ලා
- iii. බසය
- iv. මාර්ගය
- v. පාසල

03. පහත සඳහන් ක්‍රියා පදවලට සුදුසු විශේෂණ පද යොදා වාක්‍ය බැගින් නිර්මාණය කරන්න.

- **i.** බලයි.
- **ii.** දිව්වාය.
- iii.නටයි
- iv. ගයයි.
- v. ක්‍රීඩා කරති.

04. පෙළ පොතේ 92 පිටුවේ ලිඛිත අභ්‍යාසය කරන්න.